සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

9 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න

01 ආසියාව යුරෝපයෙන් වෙන් වන එක් මායිමක් වන්නේ ................................................... කඳු වැටියයි. (හිමාලය / යුරල් / හින්දුකුෂ්)

02 ආසියා මහාද්වීපයට අයත් ................................................... ප්‍රමාණයෙන් කුඩා දූපත් වලට උදාහරණයකි. (ජපන් දූපත් / ඉන්දුනීසියානු දූපත් / අන්දමන් දූපත්)

03 ජන සංඛ්‍යාවේ ස්ත්‍රීන් 100 කට සිටින පුරුෂයින් සංඛ්‍යාව ................................................... අනුපාතය වේ. (උපත් / මරණ / පුම්තිරි)

04 ලෝකයේ ............................. සපයන ප්‍රමුඛ රටක් ලෙස පාකිස්ථානය වැදගත් වේ. (චික්පී / අමු කපු / තිරිඟු)

05 කෘෂිකාර්මික නොවන කාර්යයන්හි නියැලෙන පිරිස් බහුලව දක්නට ලැබෙන ජනාවාස .................................................. ජනාවාස වේ. (ග්‍රාමීය / නාගරික / ගැමි නාගරික)

- අං 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා ප්‍රධාන වශයෙන් උෂ්ණත්වය හා වර්ෂාපතනය පදනම් කරගෙන වර්ග කර ඇත. ( )

07 වලවේ ගඟ හරස්කර වික්ටෝරියා ජලාශය ඉදි කර තිබේ. ( )

08 කිසියම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ පවත්නා වායු ගෝලීය තත්වය දේශගුණය ලෙස හඳුන්වයි. ( )

09 ශ්‍රී ලංකාවේ නිරිතදිග මෝසම ක්‍රියාත්මක වන්නේ මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළයි. ( )

10 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙන් බහුතරයක් තෙත් කලාපය තුළ ජීවත් වේ. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ජපානයේ පිහිටි මෝටර් සයිකල් නිෂ්පාදන සමාගම් අතර ඉදිරියෙන් සිටින සමාගමක් වන්නේ මින් කුමක් ද?

(1) නිසාන් සමාගම (2) ෆූජිට්සු සමාගම

(3) යමහා සමාගම (4) ටොයෝටා සමාගම

12 ශ්‍රී ලංකාවේ මාසික කුටුම්භ ආදායම වැඩිම දිස්ත්‍රික්කය වන්නේ,

(1) ගම්පහ ය. (2) කළුතර ය. (3) කුරුණෑගල ය. (4) කොළඹ ය.

13 ශ්‍රී ලංකාවේ වාරිමාර්ග පද්ධති බහුලව දක්නට ලැබෙන දේශගුණික කලාපය තෝරන්න.

(1) වියළි කලාපය (2) තෙත් කලාපය

(3) වෙරළබඩ කලාපය (4) කඳුකර කලාපය

14 ශ්‍රී ලංකාවේ ඩෙල්ටා ලක්ෂණ දැකිය හැකි ගංගා දෙකක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) මහවැලි ගඟ, කළු ගඟ (2) මහවැලි ගඟ, කලා ඔය

(3) කැළණි ගඟ, වලවේ ගඟ (4) ගිං ගඟ, නිල්වලා ගඟ

15 පහත සඳහන් රටවල් අතුරින් මොංගොලොයිඩ් මානව වර්ගය බහුලව වාසය කරන රට කුමක් ද?

(1) ශ්‍රී ලංකාව (2) ඉන්දියාව (3) දකුණු කොරියාව (4) ඉරාකය


- **පහත 'අ' තීරුවේ දැක්වෙන ගංගා ගලා බසින සාගර හෝ මුහුද 'ආ' තීරුවෙන් තෝරා ඊට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියන්න.**

| | 'අ' තීරුවේ | | | 'ආ' තීරුවේ |
|---|---|---|---|---|
| 16 | යෙනිසි, ලීනා | (.....................) | A | ඉන්දියන් සාගරය |
| 17 | අමුර්, හොවැංහෝ | (.....................) | B | ආක්ටික් සාගරය |
| 18 | ඉන්දු, මීකොං | (.....................) | C | පැසිපික් සාගරය |
| 19 | යුප්‍රටීස්, ටයිග්‍රීස් | (.....................) | D | ඒරල් මුහුද |
| 20 | සර්ඩේරියා, අමුඩේරියා | (.....................) | E | පර්සියන් බොක්ක |

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01




(අ) (i) ඉහත දැක්වෙන ආසියාවේ සිතියමෙහි A අක්ෂරයෙන් දැක්වෙන කඳුවැටිය සහ B අක්ෂරයෙන් දැක්වෙන මුහුද නම් කරන්න. (ල. 02)

(ii) C අක්ෂරයෙන් දැක්වෙන ගංගාව සහ D අක්ෂරයෙන් දැක්වෙන කාන්තාරය නම් කරන්න. (ල. 02)

(iii) E අක්ෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න. (ල. 01)

(iv) වැඩිම ජන ගහනයක් වාසය කරන චීනය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 01)

(v) මලක්කා සමුද්‍ර සන්ධිය දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල. 01)

(vi) H අක්ෂරයෙන් දැක්වෙන කලාපය හඳුන්වන නම ලියන්න. (ල. 01)

(vii) J අක්ෂරයෙන් දැක්වෙන දූපත්වල ව්‍යාප්තව පවතින වනාන්තර වර්ගය කුමක් ද? (ල. 01)

(ආ) ආසියානු මහාද්වීපයේ දක්නට ලැබෙන පහත සඳහන් භූ විෂමතා ලක්ෂණවලට උදාහරණ එක බැගින් සඳහන් කරන්න. (ල. 03)

(i) විල් -

(ii) සානු -

(iii) තැනිතලා බිම -

(ඉ) ආසියානු මහාද්වීපයේ සාපේක්ෂ පිහිටීම පහත දිශාවන් අනුව ලියා දක්වන්න. (ල. 04)


(i) උතුරින් -

(ii) දකුණින් -

(iii) නැගෙනහිරින් -

(iv) බස්නාහිරින් -

02





(1) පහත ඉහත සිතියමේ අංක 1, 2, 3 දැක්වෙන භූ විෂමතා කලාප නම් කරන්න. (ල. 03)

(2) සිතියමේ A, B, C සහ D වලින් දැක්වෙන කඳු පන්ති හතර නම් කරන්න. (ල. 04)

(3) සිතියමේ E සහ F අක්ෂරවලින් දැක්වෙන සානු දෙක නම් කරන්න. (ල. 04)

03 දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




<u>හරහට</u>

3. කඩොලාන පරිසර වල වැවෙන ප්‍රධාන ශාක විශේෂයකි.
6. මධ්‍ය කඳුකරයේ ඇති කපොල්ලකි.
8. දකුණු ආසියාවට අයත් දූපත් රාජ්‍යයකි.
9. ජපානයේ නිෂ්පාදන කර්මාන්ත අතර වැදගත් තැනක් ගන්නා කර්මාන්තයකි.
11. රබර් වලින් මේවා නිපදවයි.

<u>පහළට</u>

1. යාපන අර්ධද්වීපයේ මේවා බහුලව ඇත.
2. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ක්‍රමයකි.
4. කි.මී. 164 ක් දිග වියළි කලාපයේ පිහිටි ගංගාවකි.
5. ශ්‍රී ලංකාවේ පිහිටි වගුරු බිමකි.
7. ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වැවෙන ශාකයකි.
10. උතුරු අක්ෂාංශ $23\frac{1}{2}^0$ හඳුන්වන නම.


(ල. 11)

04 ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා කලාප ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.11)

| | ව්‍යාප්තව ඇති ප්‍රදේශ | වෘක්ෂලතාවල විශේෂ ලක්ෂණ |
|---|---|---|
| පහතරට තෙත් කලාපීය වනාන්තර | 1. ............................................ <br> 2. ............................................ | 6. ............................................ <br> 7. ............................................ |
| පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර | 3. ............................................ <br> 4. ............................................ | 8. ............................................ <br> 9. ............................................ |
| කටුපඳුරු හා ලඳු කැලෑ | 5. ............................................ | 10. ............................................ <br> 11. ............................................ |

05 (1) ශ්‍රී ලංකාවේ පිහිටි නිදහස් වෙළඳ කලාප තුන පිහිටා ඇති ප්‍රදේශ නම් කරන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 08)




06 (1) ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යාවක් සහ අඩුම ජන සංඛ්‍යාවක් ඇති පළාත් දෙක පිළිවෙලින් නම් කරන්න. (ල.02)


(2) ඔබ ඉහත සඳහන් කළ පළාත් දෙකෙහි අධි ජන ගහනයක් සහ අඩු ජන ගහනයක් ඇතිවීමට බලපා ඇති හේතු 01 බැගින් ලියන්න. (ල.04)

(3) ශ්‍රී ලංකාවේ වාර්ගික ජන සංයුතිය සහ ආගම් අනුව ජන සංයුතිය පහත ප්‍රස්තාර සටහන් වල දක්වා ඇත. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වාර්ගික ජන සංයුතිය




ආගම් අනුව ජන සංයුතිය




(a) ජන වර්ග අනුව වැඩිම ප්‍රතිශතයක් සිටින, A අක්ෂරයෙන් දක්වෙන්නේ ..................................................... ජනගහනයයි.

(b) ශ්‍රී ලංකාවේ යෝනක ජනගහනය ............................................................... අක්ෂරයෙන් දක්වේ.

(c) ජන වර්ග අනුව B අක්ෂරයෙන් ................................................................. ජන වර්ගය දක්වේ.

(d) ආගමික ජන සංයුතියට අනුව වැඩිම පිරිසක් සිටින්නේ ........................................................ ය.

(e) ආගම් අනුව ජන ගහනයෙ 9.7% ක්ම ............................................ ආගමිකයන්ය. (ල.05)

07 (1) ශ්‍රී ලංකාවේ 1:50,000 මෙට්‍රික් සිතියම් වල භූ විෂමතා ලක්ෂණ දක්වන රේඛා විශේෂය දක්වන්න. (ල.01)

(2) පහත දක්වෙන ලක්ෂණ අතුරින් 1:50,000 මෙට්‍රික් සිතියම්වල දක්වෙන භූ විෂමතා ලක්ෂණ පමණක් තෝරා ලියන්න. (ල.04)

(කපොල්ල, වී වගාව, වාරි ඇළ, තැනිතලාව, වේල්ල, කොත් කන්ද, වැව, නිම්නය)

(2) ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල පමණක් දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ තුනක් සඳහන් කර ඒවාට නිදසුන් එක බැගින් සපයන්න. (ල.06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | යුරල් | (02) | අන්දමන් දූපත් | | | (03) | පුම්තිරි | | | (04) | අමු කපු | | | (05) | නාගරික | | |
| (06) | ✓ | (07) | × | (08) | × | (09) | ✓ | (10) | ✓ | (11) | 3 | (12) | 4 | (13) | 1 | | |
| (14) | 2 | (15) | 3 | (16) | B | (17) | C | (18) | A | (19) | E | (20) | D | | | | |

(2 x 20 = 40)

## II කොටස

01 (අ) (i) හිමාලය, රතු මුහුද (ල.02) (ii) හොවැංහෝ, තාර් (ල.02)
(iii) තායිවානය (ල.01) (iv) K (ල.01)
(v) G (ල.01) (vi) මැද පෙරදිග / නිරිත දිග ආසියාව (ල.01)
(vii) නිවර්තන වැසි වනාන්තර (ල.01)

(ආ) (i) විල් - බයිකල්, බොල් කැෂ්
(ii) සානු - ටිබෙට්, පාමීර්, ඩෙකෑන්, ඉරාන, සයිබීරියානු
(iii) තැනිතලා බිම - බටහිර සයිබීරියානු තැන්න, මැන්චූරියානු, චීන මහා තැන්න (ල.03)

(ඉ) (i) උතුරින් - ආක්ටික් සාගරය (ii) දකුණින් - ඉන්දියන් සාගරය
(iii) නැගෙනහිරින් - පැසිපික් සාගරය (iv) බස්නාහිරින් - යුරෝපා මහාද්වීපය (ල.04)

02 (1) 1. වෙරළබඩ තැන්න 2. අභ්‍යන්තර තැනිතලාව 3. මධ්‍යම කඳුකරය
(2) A - නමුණුකුල B - සමනල C - පිදුරුතලාගල D - නකල්ස්
(3) E - මහනුවර සානුව F - හැටන් සානුව (ල. 03)

03 (1) හුණුගල් (2) සංවහන (3) ගිංපොල් (4) මල්වතු (5) කලමැටිය
(6) හපුතලේ (7) තල් (8) මාලදිවයින (9) යන්ත්‍රෝපකරණ
(10) කර්කටක (11) ටයර් (ල. 11)

04 නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න. (ල.11)

05 (1) කටුනායක, බියගම, කොග්ගල (ල.03)
(2) 1. කෘෂිකාර්මික 2. සේවා
3/4. හේන් වගාව / වී වගාව / එළවළු වගාව / තේ / පොල් / රබර් වගාව / සත්ව පාලනය
5/6. එකලස් කිරීමේ කර්මාන්ත / ටයර් / රෙදිපිළි / රසකැවිලි / හස්ත කර්මාන්ත
7/8 අධ්‍යාපන / සෞඛ්‍ය / විදුලිබලය / ජල සැපයුම / ආරක්ෂක / සනීපාරක්ෂක / සන්නිවේදන (ල. 08)

06 (1) වැඩිම - බස්නාහිර පළාත (2) අඩුම - උතුරු පළාත (ල. 02)
(2) බස්නාහිර පලාත - පරිපාලන හා වාණිජමය කටයුතු සංකේන්ද්‍රණ වීම / සේවා පහසුකම් බහුලවීම
උතුරු පලාත - අඩු භෞතික පහසුකම් / අඩු යටිතල පහසුකම් (ල. 04)
(3) (a) සිංහල (b) D (c) ශ්‍රී ලංකා දෙමළ (d) බෞද්ධ (e) ඉස්ලාම් (ල.05)

07 (1) සමෝච්ච රේඛා (ල.01)
(2) කපොල්ල, තැනිතලාව, කොත්කන්ද, නිම්නය (ල.04)
(2) බොකු - කොඩ්ඩියාර්, ආරුගම්, වැලිගම කලපු - මීගමුව, යාපන, පුත්තලම, හලාවත, මඩකලපුව
තුඩුව - දෙවුන්දර, ෆවුල්, සංගමන්කන්ද, පේදුරු
දූපත් - මන්නාරම, ඩෙල්ෆ්ට්, නයිනතිව්, කයිට්ස්
වෙරළඳඹ - කිරින්ද, රුමස්සල, ත්‍රිකුණාමලය ඩෙල්ටා - මහවැලි ගඟ, මී ඔය, කලා ඔය (ල.06)